

## කස්තිරම
### ඩී බී කුරුප්පු

# සොහොනේ ගෙවල් තැනීම




මේ ලිපිය ලියන්නේ හේමමාලා හේරත්ගේ කියමනක් අල්ලාගෙන ය. "සන්නස" ජූනි කලාපයට ලේඛකයා හා ලේඛන කලාව යන හිසින් ලියන ලිපියෙහි ලා ඇය ලියන දේට කිපෙන්නන්ට මුහුණ දීම ගැන කියන්නේ යකාට බය නම් සොහොනේ ගෙවල් නොසාදන ලෙස ය. ඔය කතාව මගේ හිතේ නොමැකෙන විදියට සටහන් වූයේ දැනට වසර පනස් හතකට උඩ දී ය. එවකට ලංකා විශ්ව විද්‍යාලයේ ජෝජ් රාජ ශාලාවේ පැවැත්වූ දේශනයක දී පාර්ලිමේන්තු මන්ත්‍රී සී ඒ එස් (සිංහල) මරික්කාර් ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් කියූ වේලාවේ ය.

පුදුමයකට වාගේ ඒ වචන ටික අද දවසේ මේ රටට - මේ රටේ සිංහලයන්ට - බෙහෙවින් අදාළ බවක් පෙනෙයි. "පහන" පටන් ගත් දා සිට ම එයට ලිපි සැපයූ මට ඔය විදියේ අවස්ථා කිහිපයකටම මුහුණ පාන්නට සිදු විය.

සෙනසුරාදා ගුවන් විදුලියේ මිහිඳු හාමුදුරුවන්ට යළි උපදින්නැයි ඇරැයුමක් කළ විට මම එය හාස්‍යයට ලක් කරමින් පහනට ලියුවෙමි. ඊට පසු මටත් වක් මගකින් අනතුරු හැඟවීමක් ද කර යළිත් ගුවන් විදුලියෙන් අභියෝගයක් ඉදිරිපත් කෙරුණි. "දැන් එන්න වාදෙකට" කියන කතාවය, වෙනත් වචන වලින් වුවත් කියන ලද්දේ. මම එය අසා සිටියෙමි. ඇසුවා පමණක් නොව එයින් විනෝදයක් ද ලදිමි. මට කලින් දා හැන්දෑවේ පණිවුඩය දුන් පුද්ගලයා පසුව ප්‍රශ්නයක් ඇසුවේ ය.

"ඇයි කතා කරලා උත්තර නුදුන්නේ?"

"මං ඒ හරක් විකුණලා බොහොම කල්" යනුවෙන් එයට පිළිතුරු දීම ය මා කළේ. දිවියේ හරි අඩක්ම කොළඹ නගරයේ වාසය කළ මම ඔය විදියේ බැණ අඬ ගැහුම් ඉහේ කෙස් ගානේ අසා ඇත්තෙමි. මට ම එල්ල නොවූවත් ඒ රටාව මම හොඳ හැටි හඳුනමි.

අර විදියට තමන් විවේචනය කළ කෙනකුට ගුවන් විදුලියෙන්ම අභියෝගයක් කරන්නට එම සේවයේ පාලකයන් නොහොත් අධිපතියන් ඉඩ දෙනවාද - දිය යුතු ද - යන ප්‍රශ්නයත් ඒ එක්කම ඉන් මතු වන්නේ ය. එතැන ප්‍රචාරක මාධ්‍යයක වගකීම පිළිබඳවත් නීතිය පිළිපැදීම පිළිබඳවත් ප්‍රශ්නයක් පැන නගින්නේ ය. "ප්‍රේම කරනවා" යන්න කුණුහරුපයක් - අසභ්‍ය කියමනක් - යයි නිගමනය කොට ඒ කතාවට ඉඩ දුන් වරදට නිවේදකයාටත් තව පුද්ගලයකුටත් ගුවන් විදුලියෙන් කතා කිරීම තහනම් කරන ලද්දේ ද ඔය ආයතනය විසින්ම ය. ඒ නිසා හොරාගේ අම්මාගෙන් පේන අහලා වැඩක් නැත.

ප්‍රචාරක ආයතනයක් එම වගකීම ඉටු කළ අවස්ථාවක් ද මට මතක ය. එදා තහංචියට ලක් වූයේ අනෙකෙක් නොවේ. මම ම වෙමි. පහන පටන් ගත් අලුත විය යුතු ය. එක්තරා පන්සලක පලහිලව්වක් ආරංචි වූ පසු මම ඒ සිද්ධිය අළලා ප්‍රහසනයක් ලියා යැවුවෙමි. දවස් තුනකට පසු මට දුරකතන අමතුමක් දුන්නේ එහි සංස්කාරකයකු වූ වරුණ සාවින්ද ය.

"ඩී බී අංකල්. අර ලිපිය පළ කරන්න බැහැ" ඔහු එම තීරණයට හේතු ද දැක්වී ය. මම ඒ තර්ක වලට එරෙහිව තදින් ම කතා කළෙමි. සංස්කාරකයා හොල්ලන්නට බැරිය. කට පියා ගත්තත් මම එම තීරණය අනුමත නොකළෙමි. ඇත්ත වශයෙන් ඔහු ගත් ඒ තීරණයේ ප්‍රඥාගෙ ්වරභාවය වටහා ගැන්මට මට මාසයක් පමණ ගත විය. අදත් මම ඒ ගැන ඔහු පසසමි. මෙය අවධාරණය කළ යුත්තේ සංස්කාරකයකු සතු වගකීම ඒ විදියට ඉටු කරන අවස්ථා අද අපට දක්නට නොලැබෙන නිසා ය. මා කලින් ලිපියකින් අවධාරණය කළ ආකාරයට පුවත්පතක නොහොත් සඟරාවක සංස්කාරක යනු එහි පළවන සියලු දේ ගැනම වගකීම බාර ගන්නා - ගත යුතු - පුද්ගලයා ය. වගකීම බාර ගන්නවා තබා එබන්දක් තමාගේ ප්‍රකාශනයේ පළ වු බව පවා නොදන්නා සංස්කාරකයන් මා දැක ඇත. තමා දේසනා කරන ධර්මයට නොහොත් පළ කරන මතයට පටහැණි ලිපි පවා පළවන්නට ඉඩ දී ඇත්තේ ද ඒ නිසා යයි සිතමි.

ඒ විදියේ පහර ගැසීම් වලට ඉඩ දීමෙන් සිදුවන හානිය දෙයාකාරය. එක් අතකින් එබන්දක් ලියන විවේචකයා තමාගේ ලංසුව පහතහෙළා ගන්නේ ය. කොහොමටත් විවේචකයකු ලියන දේ ගැන සැලකිලිමත් වීමට පාඨකයා පුරුදුව සිටියි. ඔහු හෝ ඇය අලුතික් යමක් සොයා දීමට අනෙක් අය නොබලන පැත්තකින් බලන්නට සමත් වන බව පාඨකයන් විශ්වාස කරන නිසා ය. එම විශ්වාසය කඩකරන විදියේ පහත් ගණයේ පහර දීමක් විවේචනයක ව්‍යාජයෙන් ලිවීම එක් වරටම කෙසේ වුවත් හෙම්හිට වත් ඇති හැටියට තේරුම් ගැනීමට බොහෝ දෙනා සමත් වන්නෝ ය. එසේ වූ තැන දී කලින් තිබුණු පිළිගැනීම තව දුරටත් අර විවේචකයාට දීමට පාඨකයා කැමති නොවනු ඇත.

අනෙක් පැත්ත ලංසුව පහත වැටීම ය. කිසියම් ප්‍රකාශනයක පළ වන දේ වගකීමකින් යුතුව කරනවා යයි පාඨකයා සිතන තාක් පමණී එම ප්‍රකාශනය කෙරෙහි පවතින විශ්වාසය රැ කෙන්නේ. පාඨකයා සමහර විට තව පැත්තක් ගැන ද උනන්දු වීමට ඉඩ ඇත. ඒ ඕපාදූප ඇසීමට ය. ප්‍රකට පුද්ගලයන් ගැන නොහොත් සමාජයේ පිළිගැනීමක් ලබන්නන් ගැන කටින් කට යන තොරතුරු - අපවාද - ඇසීමට මෙන්ම කියවීමටත් රුචියක් දැක්වීම යථා තත්වයයි. අන්න ඒ ආසාව සපුරා ලීම සඳහා දරන තැතට ප්‍රකාශයක් ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන ප්‍රශ්නය විසඳා ගැනීම සංස්කාරකවරයා වෙත පැවරෙන බරපතළ වගකීමකි.

අර වාගේ තොරතුරු ඉදිරිපත් කරන නැතහොත් විවේචනය ප්‍රහාරයක් බවට හරවා ගන්නා පුද්ගලයන් ගැන කීමට නම් මම අපොහොසත් වෙමි. එය ඒ තරම් සංකීර්ණ වූවක් නිසා ය. මෙම ගැටළුව මට ඉදිරිපත් කරන ලද්දේ මට වඩා පරිනත පුද්ගලයකු හැටියට මා එතෙක් සැළකූ තරුණ බුද්ධිමතකු විසින් ය. ඒ ඉදිරිපත් කිරීම ද වක් මගින් සිදු වූවකි. තමා එබන්දක් කරන බවක් ඔහු සිතන්නටත් නැත .

ඔහු මට පෙන්වූයේ කැලෑ පත්තරයකැයි කිව යුතු ලියවිල්ලකි. ඉස්සර අපේ ගම් වල ඉඳ හිට දක්නට ලැබුණු මේ ලියවිල්ල දැන් ඊට වඩා ශීඝ්‍රයෙන් හා පහසුවෙන් සන්නිවේදනය කිරීමේ ක්‍රම සහ විධි ඇත. එය මා දන්නා පුද්ගලයකු ගැන ය. ඔහු සරසවියේ දී කොමියුනිස්ට් කාරවකුව සිට පසුව එජාප අනුගාමිකයකු වූ බවත් දැන් ශ්‍රීලනිපයේ ඇම්බැට්ටයකු බවට පත්ව ඇති බව කියන ඒ ලියවිල්ලෙන් එල්ලවන චෝදනා මා කොතෙකුත් දෙනා ගැන අසා ඇත. ඒ වෙනස් වීම් ගැන වෙන කෙනකුට උරණ වන්නට හේතුවක් නැති බව කල්පනා කරන මට පුදුමය වූයේ අර බුද්ධිමතා එම චෝදනා අනුමත කිරීම පමණක් නොවේ. ඔහුත් ඒ වෙනස් වීම් නිසා අර පුද්ගලයා පහත් ගණයේ කෙනකු හැටියට ගණන් ගන්නා බව දැකීම ය.

අනෙක් මිනිසුන්ගේ සිතුවිලි හා ක්‍රියාකාරීත්වය පාලනය කිරීමට අපට පුලුවන් ද? බැරි නම් ඒ ගැන කුපිත වීමේ තේරුමක් ඇද්ද? තේරුමක් නැත්නම් අර වගේ කැලෑපත්තර ගස්සන්ගේ ගොඩට වැටී ප්‍රීතියෙන් පිනා යතොත් අපට අප ගැනම ආඩම්බර විය හැකි ද?

මෙයත් විවෘත ප්‍රශ්නයක් වශයෙන් තිබෙන්නට හරිමින් විවේචනයේ නාමයෙන් ප්‍රහාරයට බර වීම ගැන අදහසක් ඉදිරිපත් කරමි. මම විවේචනයත් විවේචනයට තිබිය යුතු ඉඩ කඩ ගැනත් තරයේ විශ්වාස කරන්නෙක්මි. මේ අතින් මා දකින දුබලතාව වනුයේ අපේ බොහෝ දෙනා විවේචනයට ඔරොත්තු දීමට අපොහොසත් වීම ය. මේ රටට පැමිණි සුපිරි සඟ තරුවක් කළ පූජා විධි ගැන මා ලියූ ලිපිය කියැවූ සැදැහැවතෙක් "කුරුප්පුට මොකද වෙලා තියෙන්නේ" යයි පහන සංස්කාරකයකුගෙන් ඇසීමට තරම් කුපිත වූයේ ය. දේශකයා ලේඛකයා කවියා ගායකයා වාදකයා දේශපාලකයා ආදී වශයෙන් සෙසු උදවියගේ රසිකත්වය නොහොත් සිතුම් පැතුම් කෙරෙහි බලපෑමක් කරන හා කළ හැකි කවුරු වුව ද විවේචනයට සූදානම් විය යුත්තෝ ය. එයට ඔරොත්තු දීමට බැරි නම් පසෙකට වී සිටිය යුතු ය.

වෙනත් විදියකින් කියතොත් විවේචකයාගේ ඇසට හසු කර ගත යුතු වන්නේ පුද්ගලයා නොවේ. ඔහු හෝ ඇය කරන කියන දේ ය. එයත් සමාජයේ සෙසු උදවියට බල පානවා නම් පමණකි. එම ඉලක්කය වරද්දා ගෙන පුද්ගලයකු ලුහු බැඳීම ගැන හොඳ කියමනක් මේ රටේ සුදු මිනිසුන් අතර තිබේ." බෝලයට පහර දීම වෙනුවට මිනිහාට පහර දීම" යයි ඔවුන් කියන්නේ ඒ විදියට විවේචනය රූලෙන් පිට ගෙන යාම ගැන ය. අපේ උදවිය බොහෝ විට මේ වැඩය කරන සැටි දක්නට ඇත.

අනෙක් අතට විවේචකයා අර පුද්ගලයන්ගේ ක්‍රියාකලාපය නොහොත් අදහස් විවේචනය කිරීමත් ඔහු හෝ ඇය පුද්ගලයකු වශයෙන් හෙළා දැකීමත් අතර වෙනස වටහා ගත යුතු ය. වටහා ගැනීමෙන් නොනැවතී ඒ විදියේ පුද්ගලික චරිත ඝාතනයෙන් වැළකී සිටිය යුතු ය.

වෙනත් විදියකින් කියතොත් විවේචකයාගේ ඇසට හසු කර ගත යුතු වන්නේ පුද්ගලයා නොවේ. ඔහු හෝ ඇය කරන කියන දේ ය. එයත් සමාජයේ සෙසු උදවියට බල පානවා නම් පමණකි. එම ඉලක්කය වරද්දා ගෙන පුද්ගලයකු ලුහු බැඳීම ගැන හොඳ කියමනක් මේ රටේ සුදු මිනිසුන් අතර තිබේ . "බෝලයට පහර දීම වෙනුවට මිනිහාට පහර දීම" යයි ඔවුන් කියන්නේ ඒ විදියට විවේචනය රූලෙන් පිට ගෙන යාම ගැන ය. අපේ උදවිය බොහෝ විට මේ වැඩය කරන සැටි දක්නට ඇත.

සොහොනේ ගෙවල් හදන්නන් මේ ප්‍රහාරය බලාපොරොත්තු නොවන්නටත් ඉඩ ඇත. එහෙත් එයින් වුවත් පුදුමයට පත් නොවිය යුතු බව ද ඔවුන් මතක තබා ගත යුතු ය.